# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1142 / 20 – 2000 ජූලි 27 වැනි බ්‍රහස්පතින්ද – 2000.07.27

*1142 / 20 ஆம் இலக்கம் – 2000 ஆம் ஆண்டு யூலை மாதம் 27 ஆம் திகதி வியாழக்கிழமை*

No. 1142 / 20 – THURSDAY, JULY 27, 2000

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) *(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)* (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

එල්. ඩී. – බී. 21/78. iv.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 24අ වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

චිත්‍රා ශ්‍රියාණි කරුණාරත්න,
ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2000 ජූලි මස 25 වන දින,
කොළඹ දී ය.

### නියමාවලිය

1. මේ නියමාවලිය 2000 අංක 3 දරන මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2000 අගෝස්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. මේ නියමාවලිය (මෙහි මින් මතු 'පනත' යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද 2000 මාර්තු 07 වන දින දරන නියමය මගින් පිහිටුවන ලද (මෙහි මින් මතු 'ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන) මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයට අදාල වන්නේ ය.

3. ආයතනය (මෙහි මින් මතු 'විශ්වවිද්‍යාලය' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධ වේ.

4. පනතේ විධිවිධානවලට ද යම්කිසි උචිත සාධන පත්‍රයකට සහ (මෙහි මින් මතු 'කොමිෂන් සභාව' යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට ද යටත්ව ආයතනයට පහත දැක්වෙන බලතල ඇත්තේ ය :-

(අ) මූලික වශයෙන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සහ ආයතනයේ හා විශ්වවිද්‍යාලයේ නිර්දේශ මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ඒ හා සමාන මට්ටමේ තාක්ෂණික පාඨමාලා පැවැත්වීම ;

(ආ) විශ්වවිද්‍යාලය විමසා සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව ශිෂ්‍යයන් තෝරා ඇතුළත් කිරීම ;

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව, ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවේ සහ ඒ හා සමාන මට්ටමේ (මෙහි මින් මතු "අධ්‍යයන පාඨමාලා" යනුවෙන් සඳහන් කරනු ලබන) තාක්ෂණික පාඨමාලාවලට ප්‍රවීණත්වය ලබාගත් තැනැත්තන් නිශ්චය කිරීමේ විභාග පැවැත්වීම සහ, ඒ විභාග සමත්වීමෙන් පසු සහ ආයතනය විමසා විශ්වවිද්‍යාලය විසින් අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලබන වෙනත් කොන්දේසි තත්වයක් සපුරා ලීමෙන් පසු විශ්වවිද්‍යාලයේ අභිඥාන පත්‍ර සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ලබා ගැනීමට සුදුසුකම් ලබාගත් තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම;

(ඈ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය සහ කොමිෂන් සභාව එකඟත්වය ඇතිව, අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රදානය කරනු ලැබිය යුතු අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා කවරේදැයි තීරණය කිරීම ;

(ඉ) ආයතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි හෝ පිහිටි විශ්වවිද්‍යාල හා ආයතන සමග, ආචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ඊ) අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලබන පරිදි, ආයතනයට ඇතුළු වීමට අපේක්ෂා කරන තැනැත්තන් සමත්වී ඇති විභාග සහ ගතකළ ඉගෙනීම හෝ අධ්‍යයනය ලැබූ හෝ කාල පරිච්ඡේද පිළිගන්නා ලෙස විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම සහ එවැනි නිර්දේශ ඉවත් කර ගැනීම ;

(උ) විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව හා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව අංශ පිහිටුවීම සහ දැනට පවත්නා අංශ ප්‍රතිසංවිධානය කිරීම, තීරණය කිරීම ;

(ඌ) ආයතනයේ කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ ඒවා පවත්වාගෙන යාම ;

(එ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ආචාර්ය තනතුරු, පරිපාලන තනතුරු සහ වෙනත් තනතුරු ඇතිකිරීම සහ එවැනි තනතුරු අහෝසි කිරීම හෝ අත්හිටුවීම, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව, කොමිෂන් සභාවට නිර්දේශ කිරීම ;

(ඒ) විශ්වවිද්‍යාලය විමසා අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍යදක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය කිරීම ;

(ඔ) තත්කාර්යය සඳහා විධිවිධාන සලස්වා ඇති අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව, ආයතනයෙන් බාහිර ස්ථානවල අධ්‍යයන පාඨමාලා හෝ පාඨමාලාවල කොටස් පැවැත්වීම සඳහා කටයුතු පිළියෙල කිරීම ;

(ඕ) ආයතනයේ ශිෂ්‍යයන්ගේ, ආචාර්යවරයන්ගේ, නිලධරයන්ගේ හා වෙනත් සේවකයන්ගේ වාසය, විනය හා ශුභසිද්ධිය විධිමත් කිරීම හා ඒ සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ක) නේවාසිකාගාර පිහිටුවා පවත්වාගෙන යාම, ශිෂ්‍යයන්ට නේවාසික පහසුකම් සපයන වාසස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ආයතනයේ ශිෂ්‍යයන්ගේ වාසය පිණිස අවශ්‍ය වී හැකි වෙනත් එවැනි සේවා සහ පහසුකම් සැපයීම ;

(ග) තත්කාර්යය සඳහා විධිවිධාන සලස්වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව, ආයතනයේ ශිෂ්‍යයන්ට බැංකුවලින් සහ වෙනත් නියෝජ්‍යායතනවලින් ණය ලබාගැනීමට සහාය වීම ;

(ච) තත්කාර්ය සඳහා විධිවිධාන සලස්වන රීතිවලට අනුකූලව ගාස්තු ඉල්ලීම සහ බාර ගැනීම ; සහ

(ජ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා සහ දේවල් ඉටු කිරීම.

5. පහත සඳහන් තැනැත්තන් ආයතනයේ නිලධරයන් වන්නා හ :-

(i) අධ්‍යක්ෂවරයා ; සහ

(ii) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු මේ ඡේදයේ කාර්ය සඳහා නිලධරයකු බව නියමාවලි මගින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ද එකී තනතුරක් දරන තැනැත්තා.

6. (1) ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා (මෙහි මින් මතු "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පත් කරනු ලැබිය යුතු ය. ඉන්පසු පත් කරනු ලබන සෑම අධ්‍යක්ෂවරයකුම, ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නිර්දේශිත නම් තුනකින් යුත් මූල මණ්ඩලයකින් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

එසේ වුවද, කිසිම තැනැත්තකු අනුක්‍රමික ධුර කාල දෙකකට වැඩි ගණනකට අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා, කලින් ධුරය හිස් කළහොත් හෝ (3) වන අනුඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස, ඔහු පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් හෝ ඔහුගේ වයස අවුරුදු හැටපහ සම්පූර්ණ වන දිනය වනතෙක් හෝ යන මේ දෙකින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ඔහු ස්වකීය ධුරය දරන්නේය.

(3) තත්කාර්යය සඳහා කැඳවනු ලබන විශේෂ රැස්වීමක දී, කළමනාකාර මණ්ඩලයේ නිල සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මගින් පාලක සභාව විසින් අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත්කරනු ලැබිය හැකි ය. එවැනි රැස්වීමක මූලසුන දැරීම සඳහා, එකී අධ්‍යක්ෂවරයා නොවන තැනැත්තකු, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(4) තම ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන අධ්‍යක්ෂවරයා, එසේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරනු ලැබීමට පෙර යම් උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටි තැනැත්තකු නම් සහ ඔහු කලින් දැරූ එම ධුරයෙන් විශ්‍රාම ගන්නා වයසට එළඹ නොසිටියහොත් ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ඔහු දැරූ තනතුරට ඔහු ආපසු පත් කරනු ලැබිය යුතු ය.

(5) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කටයුතු ඉටු කිරීමට අධ්‍යක්ෂවරයාට තාවකාලිකව නොහැකි වුවහොත් එසේ කටයුතු ඉටු කිරීමට නොහැකිවූ දින සිට දින හතක කාලයක් තුළදී එම ධුරයේ කාර්යය ඉටු කිරීම සඳහා සුදුසුයැයි හැඟෙන වැඩ පිළිවෙලක් (මෙහි මින් මතු "උප කුලපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා විසින් යෙදිය යුතු ය.

එවැනි වැඩ පිළිවෙලක් යොදනු ලබන තෙක් (මෙහි මින් මතු "ලේඛකාධිකාරිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කාර්ය ඉටු කරනු ලැබිය යුතුය.

(6) අධ්‍යක්ෂවරයාගේ තනතුරේ පුරප්පාඩුවක් ඇතිවුවහොත් ඒ තනතුරේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යැයි උපකුලපතිවරයා අදහස් කරන වැඩපිළිවෙලක් ඒ පුරප්පාඩුව ඇති වීමෙන් පසු දින හතක් තුළදී, ඔහු විසින් යෙදිය යුතුය. එතෙක් එම ධුරයේ එදිනෙදා කාර්යය ලේඛකාධිකාරිවරයා විසින් ඉටු කරනු ලැබිය යුතුය.

7. (1) අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණකාලීන නිලධරයෙකු වන අතර ඔහු ආයතනයේ ප්‍රධාන විධායක හා ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු නිල බලයෙන් කළමනාකරණ මණ්ඩලයේ හා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ ය. ආයතනයේ වෙනත් යම් බලමණ්ඩලයක හෝ මණ්ඩලයක හෝ යම් රැස්වීමකට පැමිණ සිටීමට සහ එහිදී කථා කිරීමට ඔහුට හිමිකම් ඇති නමුත් ඔහු ඒ බලමණ්ඩලයේ හෝ මණ්ඩලයේ හෝ සාමාජිකයකු වන්නේ නම් මිස එවැනි රැස්වීමකදී ඡන්දය දීමට ඔහුට හිමිකම නොමැත්තේය.

(2) කළමනාකරණ මණ්ඩලය විසින් කලින් කල නිත්‍යානුකූලව තමා වෙත නිකුත්කරනු ලබන විධානවලට අනුකූලව පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන යථා පරිදි පිළිපැදීම ගැන වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේය. තවද ඒ කාර්යය සඳහා අවශ්‍යයැයි ඔහු විසින් සලකන සියලු බලතල ඔහුට ඇති අතර ඒ බලතල ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(3) කළමනාකරණ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරනු ලබන බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේය.

(4) අධ්‍යක්ෂවරයා ආයතනයේ ගණන් දීමේ නිලධරයා වන්නේය.

(5) උපකුලපතිවරයාගේ විධාන යටතේ ආයතනයේ විනය පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂවරයා වගකිව යුතුය.

8. ආයතනයේ බල මණ්ඩල පහත දැක්වෙන පරිදි වන්නේ ය :-

(අ) කළමනාකරණ මණ්ඩලය ;
(ආ) අධ්‍යයන මණ්ඩලය ;
(ඇ) අංශීය කමිටු ;
(ඈ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් එවැනි මණ්ඩල.

9. (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය ආයතනයේ ශාස්ත්‍රීය සහ විධායක මණ්ඩලය වන අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :-

(1) නිල බලයෙන් පත් වන පහත දැක්වෙන නිලධරයන් එනම්,

(අ) අධ්‍යක්ෂවරයා ;
(ආ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිතයා ;
(ඇ) නාවික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිතයා ;
(ඈ) ජාතික ආධුනිකත්ව සහ කාර්මික අභ්‍යාස අධිකාරියේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිතයා ;
(ඉ) විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පීඨාධිපති ;
(ඊ) විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨයේ පීඨාධිපති.

(2) පහත දැක්වෙන වෙනත් සාමාජිකයන් එනම් :

(3) (අ) පාලක සභවේ සාමාජිකයන් අතුරින්, පාලක සභාව විසින් නම් කරනු ලබන එක් නියෝජිතයෙක් ;

(ආ) (මෙහි මින් මතු "සනාතන සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් තම සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක් ;

(ඇ) අධ්‍යයන මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඈ) කාර්මික, තාක්ෂණික, අධ්‍යාපන, වෘත්තීය හෝ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ට සේවයක් කර ඇති තැනැත්තන් අතුරෙන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක් ;

10. (1) මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර, මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මුලසුන ඔහු විසින් දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි අවස්ථාවකදී, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඒ රැස්වීමේ මුලසුන ගැනීම සඳහා සාමාජිකයෙකු පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුය.

(2) නම් කරනු ලැබූ, පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ එක් එක් සාමාජිකයා කලින් තම ධූරය අතහැර ගියහොත් මිස අවස්ථාවෝචිත පරිදි, ඔහු නම් කරනු ලැබූ, පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන අවුරුදු තුනක කාලයක් තම ධූරය දැරිය යුතු අතර ඔහු ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි නැවත නම් කරනු ලැබීමට, පත් කරනු ලැබීමට හෝ තෝරා පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේය :-

එසේ වුවද, නම් කරනු ලැබූ, පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ සාමාජිකයෙකු ඔහුගේ ධූර කාලය ඉකුත් වීමට පෙර තම ධූරය අතහැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, තමාද ධූරය අතහැර ගියහොත් මිස, තම පූර්වාගාමියාගේ ධූර කාලයෙන් නොගෙවී ශේෂ වී ඇති ධූර කාලය සඳහා පමණක් ධූරය දරන්නේය.

එසේම තව දුරටත්, නම් කරන ලද හෝ තෝරා පත්කර ගන්නා ලද හෝ එක් එක් සාමාජිකයා මණ්ඩලයේ සාමාජිකයෙකු වූයේ යම් ධූරයක් දැරීම හේතු කොටගෙන ද, ඔහු ඒ ධූරය දරනතාක් කල් පමණක් මණ්ඩලයේ ධූරය දැරිය යුතුය.

(3) මණ්ඩලයේ තෝරා පත් කළ සාමාජියකු විසින් අධ්‍යක්ෂකවරයා වෙත යවනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් තම ධූරශයන් ඉල්ලා අස්විය හැකිය.

(4) මණ්ඩලයේ නම් කළ සාමාජිකයකු විසින් පාලක සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(5) මණ්ඩලයේ පත් කළ යම් සාමාජිකයකු විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත යවනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(6) නිවාඩු ලබා නොගෙන මණ්ඩලයේ අනුයාත රැස්වීම් තුනකට නොපැමිණෙන පත් කළ යම් සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තම ධූරය අත්හැරිය තැනැත්තකු ලෙස සලකණු ලැබිය යුතු අතර 09 වන වගන්තියේ (2) (ඈ) වන ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තෙකු කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතුය.

(7) ආයතනයේ සේවා නියුක්තයකු වන මණ්ඩලයේ සාමාජිකයකුට යම් පාරිශ්‍රමිකයකට හිමිකම් නොමැති නමුත් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් වෙනත් කවර වුවද සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකිය.

(8) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූර්ණය සඳහා පැමිණ සිටිය යුතු සාමාජික සංඛ්‍යාව මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් වන්නේය.

(9) අවශ්‍ය කවර විටකදී වුවද මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය හැකි අතර, කෙසේ වුවද එක් එක් වර්ෂයේදී අට වාරයකට නොඅඩු වාර ගණනක් මණ්ඩලය රැස්විය යුතුය.

(10) සභාපතිවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන කවර අවස්ථාවක දී හෝ, මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත ඉල්ලීමක් ලැබී දින 07ක් තුළ දී හෝ, මණ්ඩලයේ විශේෂ රැස්වීමක් සභාපතිවරයා විසින් කැඳවනු ලැබිය යුතුය.

11. පනතේ විධිවිධාන වලට සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන වලට යටත්ව, පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතුය :-

(අ) ආයතනයේ දේපල සහ අරමුදල් සතුව සිටීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම;

(ආ) පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන වලට අනුකූලව, ආයතනයට අදාල සියලු කාරණා විධිමත් කිරීම සහ තීරණය කිරීම;

(ඇ) යම් නිශ්චිත කාර්ය සඳහා යෙදවීමට ආයතනය වෙත පවරා දී ඇති අරමුදල් පරිපාලනය කිරීම;

(ඈ) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, අන්තිම කැමති පත්‍ර මගින් පරිත්‍යාග සහ වෙනත් ආකාරයක වූ දේපළ ප්‍රදාන මගින් පවරනු ලබන දේපල ආයතනයට පිළිගැනීම සහ භාර ගැනීම :

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් සලකා බැලීම සහ ඒ වාර්තා සහ ඒ ගිණුමේ විශ්ව විද්‍යාලය සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම;

(ඊ) ආයතනයේ මූල්‍ය ඇස්තමේන්තු පිළියෙල කිරීම සහ ඒ ඇස්තමේන්තු විශ්ව විද්‍යාලය සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම:

(උ) අධ්‍යයන මණ්ඩලය විමසා, පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම;

(1) අධ්‍යයන පාඨමාලාවලදී ප්‍රදානය කරනු ලැබිය යුතු අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා;

(2) එකී අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලබාගැනීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් විසින් හැදෑරිය යුතු පාඨමාලා සහ ලැබිය යුතු පුහුණුව සහ සම්පූර්ණ කරනු ලැබිය යුතු වෙනත් කොන්දේසි;

(3) ආයතනයේ පරීක්ෂකවරුන් වශයෙන් පත්කරනු ලැබීමට සුදුසු තැනැත්තන් ;

(4) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍රදක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරඟ කිරීමේ ක්‍රමය සහ කොන්දේසි;

(ඌ) පනතේ විධිවිධාන වලට යටත්ව අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සෑදීම සහ එම අතුරු ව්‍යවස්ථා පැනවීම සඳහා ඒවා පාලක සභාව වෙත ඉදිරිපත් කිරීම;

එසේ වුවද, අධ්‍යයන මණ්ඩලයේ වාර්තා සලකා බැලීමෙන් අනතුරුව විනා, අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා නොසෑදිය යුතුය ;

(එ) රීති සෑදීමට බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සෑදීම සහ ඒවා පැනවීම සඳහා අවස්ථාවෝචිත පරිදි, එම රීති පාලක සභාව වෙත හෝ සනාතන සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ඒ) ආයතනයේ වැඩ කටයුතු කර ගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි පරිශ්‍ර, ගෘහභාණ්ඩ, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය ලබා දීම;

(ඔ) (i) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ආචාර්ය, පරිපාලන සහ වෙනත් තනතුරු පිහිටුවීම සහ ඒ තනතුරු අහෝසි කිරීම හෝ අත්හිටුවීම සහ

(ii) ආයතනයට පත් කරනු ලැබිය යුතු ආචාර්යවරයන්ගේ, නිලධරයන්ගේ සහ වෙනත් සේවා නියුක්තිකයන්ගේ සුදුසුකම්; විශ්වවිද්‍යාලය විමසා: කොමිෂන් සභාවට නිර්දේශ කිරීම:

(ඕ) ආයතනයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ සේවය අත්හිටුවීම. ඔවුන් සේවයෙන් නෙරපීම හෝ ඔවුන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම සඳහා විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම:

(ක) ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබීමට සුදුසු තැනැත්තන් විශ්විද්‍යාලයේ පාලක සභාවට නිර්දේශ කිරීම :

(ග) යම් නිශ්චිත කාලපරිච්ඡේදයකට සේවයේ යෙදවීමට හෝ විශ්වවිද්‍යාලයේ යම් පීඨයකින් ආයතනයකට මාරු කිරීමට සහ අනුයුක්ත කිරීමට සුදුසු තැනැත්තන් විශ්වවිද්‍යාලයේ පාලක සභාවට නිර්දේශ කිරීම :

(ච) සුදුසුයැයි මණ්ඩලය විසින් සලකනු ලබන ස්ථාවර කමිටු හෝ තත්කාර්ය කමිටු පත් කිරීම, ඒ කමිටුවලට යොමු කළ යුතු කාරණා නිශ්චය කිරීම, ඒ කමිටුවල් වාර්තා සලකා බැලීම, වෙනස් කිරීම සහිතව හෝ රහිතව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම :

(ජ) අධ්‍යයන මණ්ඩලය විමසා සහ විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව, අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් තෝරා ගැනීමේ පදනම සහ ඇතුළත් කර ගැනීමේ පදනම කොමිෂන් සභාවට නිර්දේශ කිරීම ;

(ට) ආයතනයේ ශිෂ්‍යයන්ගේ පොදු ශුභ සාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා, ශිෂ්‍යයන්ගේ නියෝජිතයන් ද ඇතුළත් වන සේ ශුභසාධන මණ්ඩලයක් පත් කිරීම සහ ඒ මණ්ඩලයේ සංයුතිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය නිශ්චය කිරීම ;

(ඩ) නොයොදවා ඇති ආදායම ද ඇතුළුව ආයතනයට අයත් මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව භාර ආඥා පනතේ 20 වන වගන්තියේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ භාර මුදල් ආයෝජනය කිරීම නීත්‍යානුකූල වන්නා වූ යම් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ පිහිටි යම් නිශ්චල දේපලක් මිල දී ගැනීම සඳහා ඒ මුදල් ආයෝජනය කිරීම හෝ ඒ ආයෝජනය වෙනස් කිරීම හෝ ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පතු වශයෙන් තැන්පත් කිරීම ; සහ

(ඪ) මේ නියමාවලිය මගින් හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක් මගින් පාවිච්චි කිරීම සඳහා අන් ආකාරයකින් විධිවිධාන සලස්වා නොමැති ආයතනයේ අන් සියලුම බලතල පාවිච්චි කිරීම.

එසේ වුවද, ස්වකීය මතය වාර්තා කොට මණ්ඩලය වෙත යැවීම සඳහා අධ්‍යයන මණ්ඩලයට අවස්ථාවක් පළමු කොට නොදී යම් ශාස්ත්‍රීය කාරණයකට අදාළ කිසිදු යෝජනා සම්මතයක් මණ්ඩලය විසින් සම්මත නොකරනු ලැබිය යුතුය.

එසේම තවදුරටත් එසේ සම්මත කර ගනු ලබන කිසිදු යෝජනා සම්මුතියක්, විශ්වවිද්‍යාලයේ එකඟත්වය නොමැතිව ක්‍රියාත්මක කරනු නොලැබිය යුතුය.

මේ ජේදයේ "ශාස්ත්‍රීය කාරණයක්" යන්නෙන්, අධ්‍යයන මණ්ඩලයේ සහ සනාතන සභාවේ පාලනයට සහ සාමාන්‍ය විධානවලට යටත් වන යම් කාරණයක් අදහස් වේ.

12. (1) පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය :-

(අ) අධ්‍යක්ෂවරයා ; ඔහු අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

(ආ) පුස්තකලයාධිකාරි හෝ ආයතනයේ පුස්තකාලය භාරව සිටින තැනැත්තා ;

(ඇ) ආයතනයේ ස්ථිර සේවයේ නියුතු ආචාර්යවරයන් ;

(ඈ) පුහුණු කිරීම් ඉංජිනේරුවරයා හෝ කාර්මික පුහුණු කිරීම් භාරව සිටින ආචාර්යවරයා ;

(ඉ) ආයතනයේ ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා දෙන්නා වූ ද එහෙත් ආචාර්යවරයන් ලෙස වර්ගීකරණය කර නොමැත්තා වූ ද ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් පස්දෙනෙක් ;

(ඊ) ආයතනයේ ශිෂ්‍යයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන ශිෂ්‍යයන් දෙදෙනෙක්, සහ

(උ) ආයතනයේ කාර්ය මණ්ඩලයට අයත් නොවන්නා වූ ද, ආයතනයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ දක්ෂතා පෙන්නුම් කර ඇත්තා වූ ද තැනැත්තන් අතුරෙන් මණ්ඩලය විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්,

(2) (1) වන ජේදයේ (ඉ) උප ජේදයේ යටතේ තෝරා පත් කර ගනු ලැබූ සෑම සාමාජිකයකුම කලින් ධුරය අත්හලහොත් මිස, ඔහු තෝරා පත් කර ගනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත තෝරා පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතුය.

එසේ වුවද එවැනි තෝරා පත් කර ගත් සාමාජිකයෙක් තම ධුර කාලය අවසන් වීමට පෙර සිය ධුරය අත්හලහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා ඔහුගේ පූර්වගාමියාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය. එසේ වුව ද, තව දුරටත් ඒ තෝරා පත් කර ගත් සාමාජිකයා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු වූයේ යම් ධුරයක් දැරීම හේතුකොටගෙන ද ඔහු එම ධුරය දරන තාක් කල් පමණක් අධ්‍යයන මණ්ඩලයේ ධුරය දැරිය යුතු ය.

(3) ඉහත (1) වන උප ජේදයේ (ඊ) වගන්තිය යටතේ තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයන් :-

(අ) විභාග සහ අදාළ කරුණු සම්බන්ධයෙන් අධ්‍යයන මණ්ඩලයේ යම් රැස්වීමකින් බැහැර කරනු ලැබිය යුතු අතර, එසේ ඔවුන් බැහැර කිරීම නොතකා ඒ රැස්වීම යථා පරිදි පවත්වන ලද රැස්වීමක් ලෙස සළකනු ලැබිය යුතු ය.

(ආ) ඒ සාමාජිකයන් ආයතනයේ ශිෂ්‍ය භාවය දරන කාල සීමාව තුළ දී ඔවුන් ධුර දැරිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා අමතන ඉල්ලීමක් මගින් අධ්‍යයන මණ්ඩලයට තෝරාපත් කර ගනු ලැබූ යම් සාමාජිකයකුට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) අධ්‍යයන මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූර්ණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය.

(6) අධ්‍යයන මණ්ඩලය අවශ්‍ය කවර විටක වුවද රැස්විය යුතු අතර, කෙසේ වුවද, එක් එක් වර්ෂයේ දී වාර දහයකට නොඅඩු වාර ගණනක් එය රැස් විය යුතු ය.

13. (1) පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනයේ අධ්‍යයන, අධ්‍යාපනය, පර්යේෂණ සහ විභාග පිළිබඳ පාලනය සහ සාමාන්‍ය විධානය අධ්‍යයන මණ්ඩලය සතු වේ.

(2) (1) වන අනුජේදයෙන් අධ්‍යයන මණ්ඩලය වෙත පවරා දී ඇති බලතලවල ව්‍යාප්තියට අගතියකින් තොරව, අධ්‍යයන මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය :-

(අ) මණ්ඩලය විසින් යොමු කරනු ලබන යම් කාරණයක් සලකා බලා ඒ පිළිබඳව වාර්තා කිරීම ;

(ආ) අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩ සටහනක් හෝ වැඩ සටහන් සහ විභාග සම්බන්ධයෙන් වූ කාරණා මත යම් අංශයක හෝ අංශවල හෝ වාර්තා සලකා බැලීමෙන් පසු මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම;

(ඇ) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් හෝ සලකා බලා වාර්තා කිරීම සඳහා, අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ද ඇතුළත් වන කමිටු පත් කිරීම ;

(ඈ) පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුළු කර ගැනීම සහ විභාග සම්බන්ධයෙන් වූ අවශ්‍යතා පිළිබඳ අංශයකින් හෝ අංශවලින් හෝ ඉදිරිපත් කරනු ලබන වාර්තා සලකා බැලීමෙන් පසු මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඉ) විභාග පරීක්ෂකවරයන් වශයෙන් සුදුසු තැනැත්තන් සම්බන්ධයෙන් අංශයකින් හෝ අංශවලින් හෝ ඉදිරිපත් කරනු ලබන වාර්තා සලකා බැලීමෙන් පසු මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම :

(ඊ) නියමිත විභාග සමත්වීමෙන් පසු සහ නියමිත වෙනත් කොන්දේසි සපුරාලීමෙන් පසු අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කරනු ලැබීමට සුදුසුකම් ලබන තැනැත්තන් සම්බන්ධයෙන් අංශයක හෝ අංශවල හෝ වාර්තා සලකා බැලීමෙන් පසු මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(උ) අංශයක හෝ අංශවල හෝ වාර්තා සලකා බැලීමෙන් පසු, අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරඟ කළ යුතු ආකාරය සහ තරග කිරීමේ කොන්දේසි මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඌ) අංශයක හෝ අංශවල හෝ වාර්තා සලකා බැලීමෙන් පසු, අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කරනු ලැබීමට සුදුසු තැනැත්තන්ගේ නම් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

14. (1) එක් එක් අංශය සඳහා ප්‍රධානියකු සිටිය යුතු අතර, ඔහු ඒ විශේෂඥ ක්‍ෂෙත්‍රයේ ස්ථිර ආචාර්යවරයන් අතුරෙන්, අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත, මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) එක් එක් අංශයේ ප්‍රධානියා, යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ඔහු පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් එම ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වේ.

(3) නිවාඩු ලබා ගෙන සිටීම, රෝගාතුරවීම හෝ වෙනත් යම් හේතුවක් නිසා, යම් අංශ ප්‍රධානියකුට මාස තුනකට නොවැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී ඔහුගේ ධුරයේ වැඩ බැලීමට ඒ අංශයේ වෙනත් ආචාර්යවරයකු අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. එසේ වුවද, විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් හෝ නිසා යම් අංශ ප්‍රධානියකුට මාස තුනකට වැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ඒ අංශ ප්‍රධානියාගේ ධුරය හිස් වූ ලෙස සැලකිය යුතු අතර, අධ්‍යක්ෂවරයා විසින් අංශයේ ආචාර්යවරුන් අතරින් නව අංශ ප්‍රධානියකු පත් කරනු ලැබිය යුතුය.

15. (1) පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන ආංශික කමිටුවක් එක් එක් අංශය සඳහා තිබිය යුතු ය :–

(අ) ආංශික කමිටුවේ සභාපතිවරයා විය යුතු අංශ ප්‍රධානියා ;

(ආ) ඒ විශේෂඥ ක්‍ෂෙත්‍රයේ ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා දෙන සියලුම ස්ථිර කාර්ය මණ්ඩලය ;

(ඇ) ආංශික කමිටුව විසින් තෝරා පත් කර ගනු ලබන කර්මාන්ත ක්‍ෂෙත්‍රයේ නියෝජිතයන් දෙදෙනෙක්.

(2) එක් එක් ආංශික කමිටුව විසින් පහත දැක්වෙන කර්තව්‍ය ඉටු කිරීම කරනු ලැබිය යුතුය :-

(අ) අධ්‍යයන මණ්ඩලය විසින් එය වෙත යොමු කරනු ලබන යම් කාරණයක් සලකා බලා වාර්තා කිරීම ;

(ආ) ඒ අංශයේ විශේෂඥ ක්ෂේත්‍රයට අදාළ අධ්‍යයන පාඨමාලාවලට සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් නිර්දේශ සහ වාර්තා අධ්‍යයන මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

(3) එක් එක් ආංශික කමිටුවේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූර්ණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(4) එක් එක් ආංශිය කමිටුව අවශ්‍ය වන කවර විටක වුවද රැස්විය යුතු අතර, එක් එක් වර්ෂයේ දී තුන්වරකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

16. ආයතනයේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂයම වන්නේ ය :

17. (1) ආයතනයට, (මෙහි මින් මතු 'අරමුදල' යනුවෙන් සඳහන් කරනු ලබන) තාක්ෂණික ආයතන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් තිබිය යුතු අතර, පහත දැක්වෙන මුදල් ඊට ගෙවනු ලැබිය යුතුය :-

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනය වෙත ගෙවනු ලැබිය යුතු සියලු ගාස්තු ;

(ආ) පරිත්‍යාගවලින් ලැබෙන සියලු ආදායම් ;

(ඇ) ආයතනයට ආධාර වශයෙන් පාර්ලිමේන්තුව විසින් සපයනු ලදුව වියදම් ගෙවීම සඳහා කොමිෂන් සභාව විසින් දෙනුලබන සියලු මුදල් ; සහ

(ඈ) වෙනත් යම් මූලාශ්‍රයකින් ආයතනයට උපචිත විය හැකි වෙනත් සියලු මුදල්.

(2) ඒ ඒ ආදායම් ශීර්ෂ යටතේ වර්ගීකරණය කොට, යම් මාසයක දී අරමුදලට ගෙවන ලද සියලු මුදල් ප්‍රමාණ පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ඊළඟ එළඹෙන මාසය අවසාන වීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාවේ දැන ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

18. (අ) මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියට සහ ආකාරයට අනුව ආයතනයේ ගිණුම් පවත්වාගෙන යාම ;

(ආ) අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් ප්‍රමාණ භාරගෙන ඒ මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැර කිරීම ;

(ඇ) අනුමත කළ සියලු ගෙවීම් කිරීම : සහ

(ඈ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඇස්තමේන්තු සහ ඊළඟට එළඹෙන වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය විසර්ජන මණ්ඩලය සඳහා පිළියෙල කිරීම

අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

එසේ වුවද, යම් නිශ්චිත කාර්ය සඳහා කරන ලද ප්‍රදාන වලින් හෝ නිශ්චිත පරමාර්ථ සඳහා කරන ලද පරිත්‍යාගවලින් ලැබෙන ආදායම ආයතනයේ ගිණුම්වල වෙන් වෙන් වශයෙන් දැක්විය යුතු අතර, එසේ ලැබෙන ආදායමෙන් යම් ගෙවීමක්, ඒ ප්‍රදාන හෝ පරිත්‍යාග හෝ කරන ලද්දේ කවර කාර්ය හෝ පරමාර්ථ හෝ සඳහා ද ඒ කාර්ය හෝ පරමාර්ථ හෝ නොවන යම් කාර්යයක් හෝ පරමාර්ථයක් හෝ සඳහා නැතහොත් ආයතනයේ සාමාන්‍ය කාර්යය සඳහා නොකළ යුතු ය.

19. (1) ආයතනයේ කටයුතුවලට අදාළ වාර්ෂික ගිණුම් ප්‍රකාශයක් සහ සංඛ්‍යාලේඛන, කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන විස්තර ද ඇතුළුව එසේ නියම කරනු ලබන ආකෘතියට හා ආකාරයට අනුව ආයතනය විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතනයේ කාර්යාලයේ තබා තිබිය යුතු ය.

20. උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් සම්බන්ධයෙන් පනතේ xiii වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ ගිණුම් සම්බන්ධයෙන් සහ ඒ ගිණුම් විගණනය කිරීම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

21. (1) ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සඳහා, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි වූ, නිලධරයන්ගෙන්, ආචාර්යවරයන්ගේ සහ වෙනත් සේවා නියුක්තයන්ගෙන් ආයතනයේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු ය.

(2) ආයතනය පිහිටුවනු ලැබීමේ දී විශ්වවිද්‍යාලය විසින් ස්වකීය කාර්ය මණ්ඩලය අතුරෙන් කරනු ලබන මුදා හැරීම් මගින් හෝ අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් හෝ විශ්වවිද්‍යාලය විසින් හෝ කරනු ලබන පත්වීම් මගින් ආයතනයට කාර්ය මණ්ඩලයක් ලබා දිය යුතු ය. ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීමට සහ ඒ සම්බන්ධයෙන්, පනතේ X වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවකයකු ආයතනයේ සේවය සඳහා පූර්ණ කාල පදනමක් මත මුදා හැර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරට හිමි වේතන හා දීමනා ආයතනය විසින් ඔහුට ගෙවිය යුතු ය. අනෙක් අවස්ථාවල දී විශ්වවිද්‍යාලය විමසීමෙන් පසුව සහ කොමිෂන් සභාවෙ අනුමැතිය ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන දීමනා ඒ නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

(4) අධ්‍යක්ෂවරයාගේ විධානවලට හා විනය පාලනයට ආයතනයේ කාර්ය මණ්ඩලය යටත් විය යුතු ය.

22. යම් තැනැත්තකු යථා පරිදි තෝරා පත් කරගනු ලැබ තිබේද, නැතහොත් නම් කරනු ලැබ තිබේද නැතහොත් යම් තැනැත්තකුට ආයතනයේ යම් බලමණ්ඩලයක, මණ්ඩලයක හෝ කමිටුවක හෝ ආයතනයේ වෙනත් යම් මණ්ඩලයක හෝ සාමාජිකයකුව සිටීමට හිමිකම් ඇත්තේ ද යන්න සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් ඒ ප්‍රශ්නය කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු අතර ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

23. මෙම නියමාවලියෙහි –

"පනත" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා එම පනතට කරන ලද සංශෝධන අදහස් වේ.

"උචිත සාධන පත්‍රය" යන්නට ඒ සඳහා පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය.

"කොමිෂන් සභාව" යන්නෙන් පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපදාන කොමිෂන් සභාව අදහස් වේ. "ආචාර්යවරයා" යන්නෙන් මහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් හෝ කථිකාචාර්යවරයෙක් සහ යම් තනතුරක් දරන තැනැත්තෙක් ආචාර්යවරයකු වශයෙන් නියමාවලි මගින් නියම කරනු ලැබ ඇද්ද ඒ තැනැත්තා අදහස් වේ.